


# තේ තතු

ISSN - 1391-6785

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි

පළවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජූලි - දෙසැම්බර්


## තේ ඉඩම්වල පාංශු විශ්ලේෂණය

තේ ඉඩම් වල පාංශු විශ්ලේෂණය මගින් පසේ ඇති පෝෂක ප්‍රමාණයන් පිළිබඳව ප්‍රමාණාත්මක ඇගයීමක් කළ හැකිය. පසේ ආම්ලිකතාවය මෙන්ම ශාක පෝෂණය සඳහා පසේ ඇති අත්‍යාවශ්‍යය පෝෂක ප්‍රමාණයන් නියමිත මට්ටමකින් පවතිනවාද යන්න මෙමගින් අවබෝධ කර ගත හැක. කෙසේ නමුත් තේ පර්යේෂණායතනය මගින් නිර්දේශ කරණු ලබන ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම හා පොහොර නිර්දේශයන් නිසි පරිදි සිදු කරනු ලබන්නේ නම්, පසේ පී.එච්. අගය දැන ගැනීමට හැර අනෙකුත් පෝෂක ද්‍රව්‍යයන් නිසි මට්ටමක පවතින්නේ දැයි දැන ගැනීම සඳහා පාංශු විශ්ලේෂණයක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් සාමාන්‍යයෙන් පැන නොනගී. ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම වේදයන් අතපසු කොට අවසානයේදී පාංශු විශ්ලේෂණ වල පිහිට පැතීමට යාම සියළු අඩු ලුහුඩුකම් මගහරවා ගැනීම සඳහා ඇති ප්‍රායෝගික පිළිතුරද නොවේ.

තේ ශාකය සඳහා පොහොර නිර්දේශයන් සිදුකරනු ලබන්නේ ' ප් තිබෙන පෝෂක ප්‍රමාණය පමණක්ම සැලකිල්ලට ගෙන නෙ. . මෙහිදී දේශගුණික කලාප වලට ආවේනික වූ ලක්ෂණ, පසේ සාරවත්භාවය සහ ක්ෂේත්‍ර පර්යේෂණ මගින් ලබාගත් අස්වනු ප්‍රතිචාරයන්ද දැඩි ලෙස සැලකිල්ලට භාජනය කෙරේ. මේ සියළු කරුණු සලකා බලා උඩරට, මැදරට, පහතරට හා ඌව යනාදී තේ වගා ප්‍රදේශයන්ට අනුකූල වන පරිදි මේරූ තේ සඳහා පොහොර නිර්දේශයන් කර ඇත. මේ නිසා තේ ශාකයේ පෝෂක ඌනතා දක්නට ලැබෙන අවස්ථාවකදී හැරෙන්නට, නිර්දේශ කරනු ලබන පොහොර යෙදීම් හි වෙනසක් සිදු නොවේ. එබැවින් තේ ඉඩමේ පෝෂක ඌනතාවයක් ඇති බවට සැක කළ හැකි ලක්ෂණ තිබේ නම් පමණක් පාංශු හා ශාක පත්‍ර විශ්ලේෂණයට යොමුවීම ප්‍රමාණවත්වේ. කෙසේ නමුත් මෙම ලිපියෙන් විස්තර කිරීමට අදහස් කරනුයේ පාංශු විශ්ලේෂණය පිළිබඳව පමණි. මෙහිදී විශේෂයෙන් සැලකිය යුතු කරුණක් වන්නේ ශාක වල පෝෂක ඌනතා ඇතිවී තිබෙන්නේ, පසේ ඇති පෝෂක ඌනතාවය නිසාද, පසේ පවතින පෝෂක ප්‍රමාණයන්ගේ අසමානතාව නිසාද එසේ නැතහොත් රෝග පලිබෝධ හානි නිසා ශාක පටක විනාශවීම හේතුවෙන් පෝෂක ද්‍රව්‍ය ශාකයේ අනිකුත් කොටස් කරා ගමන් කිරීමට ඇති අපහසුව නිසාද යන්න පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.

සාමාන්‍යයෙන් තේ ඉඩම්වල පාංශු පරීක්ෂාවක් සිදුකරනු ලබෑ. ශ් කප්පාදුවකට ආසන්නයෙනි. එවිට පසේ පී.එච් අගය අනුව යෙදිය යුතු ඩොලමයිට් ප්‍රමාණය තීරණය කළ හැක. පාංශු පරීක්ෂණයකදී ක්ෂේත්‍රය නිසි ලෙස නියෝජනය වන පරිදි පස් සාම්පල් ලබාගැනීම ඉතාම වැදගත්වේ. වඩාත් නිරවද්‍ය ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පස් ලබා ගත යුතු ක්ෂේත්‍රය, එහි විශාලත්වය, භූමියේ පිහිටීම, ජලවහනය, සෙවන ඇති තැන්, වගාවේ වයස් කාණ්ඩය, යනාදී කරුණු සැලකිල්ලට ගෙන ප්‍රමාණවත් විශාලත්වයකින් යුක්ත කට්ටි වලට වෙන් කර ගත යුතුය. මෙසේ වෙන් කර ගත් පසු පස් ලබා ගත යුත්තේ අහඹු ලෙස "සිග් - සැග්" ආකාරයටය. (අක්කරයටය ස්ථාන 10 කින් පමණ සාම්පල ලබා ගැනීම සෑහේ.) මතුපිට ඇති දිරා ගිය කොළ රොඩු ඉවත්කිරීමෙන් පසු, පස් සාම්පල තේ පඳුරකට ආසන්නව ලබා ගත යුතු අතර, 6" ක් දක්වා ගැඹුරට ඇති මතුපිට පස් තට්ටුව අවගාරයක් හෝ අලවංගුවක් භාවිතා කර ලබා ගත හැක. මේ අයුරින් ස්ථාන කිහිපයකින් ලබා ගත් පස්, පොලිතින් කොළයක් මත අතුරා හොඳින් කලවම් කර ගල්, බොරළු, මුල් කැබලි ඉවත් කොට ඉන් ග්‍රෑම් 500 ක් පමණ පොලිතීන් කවරයකට දමා සීල් කර අදාල විස්තර ද සමඟ තේ පර්යේෂණායතනයට භාරදිය යුතුය. තේ පර්යේෂණායතනයට අයත් පාංශු විද්‍යාගාර තලවකැලේ, වලහන්දුව හා මහනුවර හන්තානේ පිහිටා ඇත.


**ආචාර්ය කපිල සොයිසා, ජනක අබේවර්ධන**